සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage
Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage
Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage - Richmond Collage

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018

General Certificate of Education (Adv. Level) Examination, 2018

13 ශ්‍රේණිය

| | | | |
|---|---|---|---|
| සිංහල I<br>rpq;fsk; I<br>Sinhala I | Richmond Collage<br>Galle | 71 S I | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>*Three hours* |

උපදෙස් ׀

* පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.

01) පහත සඳහන් උද්ධෘත කියවා ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ)

යක්ෂයා මේ ධර්මදේශනාව අසා ප්‍රසන්න වූ සිත් ඇතිව බෝධිසත්ත්වයන්ට කියන්නේ "මම තොප කෙරෙහි ප්‍රසන්න වූයෙමි. ප්‍රසන්න වූ මම එක් මලණුකෙනෙකුන් තොපට දෙමි. කවුරුන් ගෙනෙමිදැ" යි කීය. ඒ අසා බෝධිසත්ත්වයෝ "බාලම මලණුවන් ගෙනෙව" යි කිවූහ. දියරකුසු කියන්නේ "පණ්ඩිතයෙනි, තොපි උදක් දේවධර්මය දන්නා පමණෙක්මය. එපමණක් විනා ඒ ධර්මයෙහි තොප පවත්නේ නැතැ" යි කීය. "කවර කාරණයෙකින් දැ" යි කී කල්හි "වැඩිමහලු තැනැත්තන් තබා බාල තැනැත්තන් ගෙන්වන හෙයින් තොප ජෙට්ඨාපචායන කර්මය නොකරන හෙයිනැ" යි කීය. එබස් අසා මහබෝසතාණෝ කියන්නේ, "එම්බල යක්ෂය, මම දේවධර්මයත් දනිමි. දේවධර්මයෙහිත් පවතිමි."

01. ධර්ම දේශනාව අවසානයේ ප්‍රසන්න සිත් ඇති වූයේ කාටද?
02. බාලම මලණුවන් ගෙන එන්න යැයි කීවේ කවුද?
03. බාලම මලණුවන් ගෙන එන්න යැයි කී විට රකුසා කුමක් ප්‍රකාශ කළේ ද?
04. "ප්‍රසන්න", "ජෙට්ඨාපචායන" යන වචනවල අර්ථ පහදන්න.

(ලකුණු 4)

(ආ)

'සෙසු වුවමනා දවස් නැති හෙයින් අද ම වුවමනා ද? උත් හැම හැයි දැ' යි කිවුය. 'එසේ කල මෙසා මහත් සම්පත් ඇති මුඹ ම තනිව තබාගෙන අනුභව කරන්නේ කෙසේද? මුඹවත් මටත් අප දෙදෙනාවත් පමණකට යටත් පිරිසෙයින් සාල් එක්නැළි මනාවක් විවර වන හෙයින් එපමණක් පිසමෝ දැ යි විචාරා තෙපි කා කුමක් කරා දැ' යි කී කල්හි උන්ගේ මසුරු අදහස සියලු ලෙසින් දැනලා 'එසේ වී නම් මුඹ පමණකට කබලු පිසෙම දැ' යි විචාළෝය. ඒ ගිවිසලා 'මෙතැන දී පිසතොත් බොහෝ දෙන ආලය කෙරෙති. සාල් ඇරගන්නා කලත් නොකඩ සාල් හැර නොගෙන කඩසාල් හැරගෙන ඉඳින්නකුත් කබල් පූකිරිත් හැරගෙන කිරිපැණිත් මීත් කබලුව කාගන්නා විතර මුත් වඩාත් හැර නොගෙන සත්මාල් මාළිගාවේ උඩුමාලට නැඟිලා පිසව. මමත් උඩු මාළේ ම කමි' යි තමන්ගේ මසුරු කමෙහි තරම සුගකුත් පසුව හඟවන්ට නොතබා හඟවාපුය.

[ දෙවන පිටුව බලන්න

01. තනිව අනුභව කරන්නේ කෙසේ දැ යි ඇසුවේ කාගෙන් ද?
02. සිටුතුමාගේ දැඩි තෘෂ්ණාව කියා ඇත්තේ කෙසේ ද?
03. කබලු පිසින්නයැ යි කීවේ කොහි සිට ද?
04. **"එක් හැලි මනාවක්"**, **"ඉඳින්නතැක්"** යන වචනවල අර්ථ පහදන්න.

(ලකුණු 4)

(ඈ)

"දෙවයන් වහන්ස දකුණු ජනපදයෙන් නුවරට නිමන සියලු අය මුබය ශාලි රාජ කුමාරයන් වහන්සේ ම ඇරගන්නා සේක. එසේ හෙයින් ඉදිරියේ දවස රාජ කටයුතු කිරීමට නොපිළිවන." යි කීහ. ඒ බස් අසා රජ්ජුරුවෝ දකුණු දිග මාළිගාව හරවා රාජ කුමාරයන්ට බස්නාහිර වීථියෙහි මනහර ප්‍රසාදයක් කරවා දුන් හ. රාජ කුමාරයන් එහි වසන කල්හි දු බස්නාහිර දිසා භාගයෙහි සියලු දෙසින් මනුෂ්‍යයෝ පෙර පරිද්දෙන් බොහෝ පඬුරු ගෙනවුත් දෙති. ගෙනා ගෙනා පඬුරු පෙර සේ ම රාජ කුමාරයෝ දන් දෙන්නාහු ම ය.

01. රාජ පුරුෂයන් රජුට කුමක් පැවසුවේ ද?
02. එයට පිළියම් ලෙස රජු කුමක් කළේ ද?
03. මිනිසුන් රාජ කුමාරයාට කුමක් ගෙන එන ලද ද?
04. **"අය මුබය"**, **"ප්‍රසාදය"** යන වචනවල අර්ථ පහදන්න.

(ලකුණු 4)

(ඈ)

ළඳුන් සිනිඳු කොමළත වැළඳි — සිහිලසේ
තඳුන් මෙහිමි සොඳ බඳ රඳන ගුණ — රුසේ
නුඳුන් අතුරු උරගුන් දරණ කළ — තෙසේ
සඳුන් තුරෙක සරියයි කියමෝ ද — කෙසේ

සුරතුරු අයුරු අතු අත රැඳි — කනාලිය
නිරතුරු සිටින රුසිරි සර — මනාලිය
පියකරු මෙරද රුසිරින් මද — දිනාලිය
සුරගුරු හට ද ඉන් නොම හැක — වනාලිය

1. රජුගේ රූප සුන්දරත්වය කවියා දකින්නේ කෙසේ ද?
2. ඒ සඳහා යොගා ගත් උපමා කවරේ ද?
3. සුරගුරු හට වැනිය නොහැකි බව කියනුයේ කුමක් ද?
4. **"සඳුන් තුරෙක සරියයි"** යන්නෙහි කාව්‍යෝක්ති ලක්ෂණ පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ඉ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

1. "තෙපි මුසුප්පු නොවව"
2. "කවුරු දනිද්ද මිනිස් කෙනෙක් වී නම් මෝ තොම මරාපියන්නී"
3. "ඉදිරියේ දවස රාජ කටයුතු කිරීම නොපිළිවනැ"
4. "ඇයි බොට මතක් නැද්ද."
5. "අක්කා නැද්ද ඒ විදියෙ වැඩ කළේ?"
6. "අන්න අපූරුයි.මැ ඔබට ම පහළ වුණු ශ්‍රී කාන්තාවක්නේ"

(ලකුණු 08)

[ තුන්වැනි පිටුව බලන්න

(ඌ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

සිරුරේ දාහය සනසන තලවැල්
        සිසිලස ගත් බව දිනිමි        වැවේ
රත්සර හෙළැ'ඹුල නිලුපුල් මී ගඳ
        නැහැ දුඩු අතරින් ළයට        කැවේ
මායා සිහිනය මැද්දේ පිහිනමි
        එනමුදු නොදකිමි එළිය        ලොවේ
හදවත කොඳුරයි, එහි සටහන් ළඟ
        හිඳ පිටපත් කළ හැකි ද        දුවේ?

විසිතුරු සිතිවිලි අතරින් පැන යති
        මී මැස්සෝ ගුමුගුමුව        දිදී
අසරණ මා දැක අමතන විලසින්
        සුළඟින් තුරුපත් එකට        වදී
වන විහඟුන්ගේ ගීතය ඉහිරෙහි
        විලිකුන් පලතුරු සමඟ        බිඳී
ලෝකය පිබිදී දොඩමලු වී ඇත
        මා පමණක් නෙත අඳව        නිදී

වැව් බත්දේසිය සොබා සොඳුරි වෙත
        පිළිගන්වන විට ඇඹුල        තබා
පෙර මෙන් අහසේ පායන රත් හිරු
        වගුරන්නෙ ද මිණි කිරණ        පබා
වදුලේ පරඬැල් අතුළ කැදැල්ලේ
        තනියම පසු වන කුරුලු        බබා
මව නැති අතරේ කිවි කිවි ගෑවේ
        ඉගිළෙන පිණසයි ළඟදි        නොබා

අංකුර පහරින් ඉවුරේ පස් බිඳ
        ගවයෝ දිය බී යති ද        දොළින්
කඩි පෙරහැර වැල නොකැඩී ඇදෙති ද
        තවමත් තිල් තණ පිඩැලි        වලින්
දියණිය, ඔබ මව මට අමතන්නිය
        සැඟ වී හිඳ උණ පඳුරු        තුළින්
අමුණා මල්දම් මා ගෙල සරසනු
        ඇ වැළලූ තැන පිපුණ        මලින්

උතුසුම සිහිලස හඳුනමි ගුණයෙන්
        රෑ දාවල එක පරිදි        ගෙවේ
කැලඹී පාවෙමි දූම් රොටුවක් මෙත්
        යටගිය මතකෙහි සිහින        ලොවේ
මවගේ කටහඬෙහි වෙනසක් නොමැතිව
        සැඟවී ඇත ඔබ මුවෙහි        දුවේ
ඇ දුන් රත්මල් මඳහස් එපරිදි
        ඇද්දැයි අතගා බලමි        මුවේ

[ හතර වැනි පිටුව බලන්න

ඔබගේ මව සහ මා එක් දවසක්
    අවර ගිරෙහි හිරු ගිලෙන    පැයේ
හිඳගෙන හුන් විට පුලින් තලාවක
    ඈ විමසූවා වැතිර    ළයේ
'සැන්දෑ වෙලපෙති පරයන තොල්පෙති
    දූ මැණිකක ඔබ රිසි ද    පියේ?'
ඈ කී වදනෙහි සැබෑව දක්නට
    පෙර මගෙ නෙත් දෙක නැතිව    ගියේ

මදූ මල් පෙතිවල සිනිඳු මොළොක් බව
    මවගේ අත්වල තිබුණි    එදා
ඈ නැති වූයේ ඒවා නැතිකොට
    පොඩි දූවගේ අත් දෙකට    පුදා
නා රොන් වැනි මුදු කෙහෙරැලි පීරා
    සුවඳ අලෙවි දී දෙකට    බෙදා
සරසන සැටි ඔබ දක්නට නොලැබී
    ඇති වෙයි අද ඇස්වලට    රැදා

ආලය උල්පත් දෙතැනක පිපිරී
    මහ ගංගාවක් පරිදි    සෙනේ
උතුරා යද්දී නැංවූ සේතුව
    නොදකී ඇස් දෙක සිතට    පෙනේ
ඇයි මෙතරම් නෙත පොඩි කම්මුල්වල
    සුරතල් දූව අඬනව ද    අනේ?
ඔබගේ කඳුළැලි අත ගැවෙන විට
    ලේ තැවරෙන මෙන් අතට    දැනේ

(ලකුණු 16)

02) "කාව්‍යාත්මක බස් වහරක් යොදා ගැනීම සද්ධර්මරත්නාවලි කතුවරයාගේ විශේෂත්වය විය. නියමිත කථාවස්තු දෙකක් වත් ගෙන මේ මතය පිරික්සන්න.

නැතහොත්,

"සුචරිතවාදී ජීවිතයකට අවැසි කරුණු ඉදිරිපත් කිරීම ජාතක සථාකරුගේ පරමාර්ථය විය." නියමිත කථා ඇසුරෙන් මෙය පහදන්න.

(ලකුණු 15)

03. සද්ධර්මාලංකාරය කතුවරයා වඩා යහපත් සමාජයක් ගොඩනැගීම පරමාර්ථය කොට ගෙන ඇති බව නියමිත කථා දෙකක් ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 15)

04. "ගිරා සන්දේශය විශිෂ්ට සන්දේශයකි." නිදසුන් ගෙනහැර දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

05. "ජීවිතයේ සංකීර්ණ ප්‍රශ්න රාශියකට මුහුණ දෙනු ලබන චරිතයක්සේ තොරිකෝගේ චරිතය පිළිබිඹු වේ." මළගිය ඇත්තෝ නවකථාව තුළින් මේ මතය පැහැදිලි කරන්න. (ලකුණු 15)

06. මිනිස් සිතිවිලි සහ මනෝභාවයන්හි සැබෑ තොරතුරු හෙළි කිරීමට කෙටිකතාකරුවන් දැක් වූ සාමාර්ථය නියමිත කෙටි කතා තුනක්වත් ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 15)

07. ස්වභාව සෞන්දර්යය පුද්ගලාන්තර සිතිවිලිවල ස්වරූපය කවියට නැඟීමට කොළඹ යුගයේ කවියන් ගත් උත්සාහය නියමිත පද්‍ය පන්ති තුනක්වත් ගෙන පහැදිලි කරන්න. (ලකුණු 15)

08. "රත්නාවලි නාට්‍යය අභව්‍ය නොවූ නාට්‍යයකි." විමසන්න.

(ලකුණු 15)

රිච්මන්ඩ් විද්‍යාලය - ගාල්ල Richmond College, Galle

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018

[illegible] 2018

General Certificate of Education (Adv. Level) Examination, 2018

71 S II

සිංහල II
Sinhala II

පැය.03 යි

**උපදෙස් :**

* I කොටසේ පළමු ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද ඇතුලු ව **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න:
* 01 ප්‍රශ්නයේ ඇති සියලුම අනු කොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
* I කොටස II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

01. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1 **හ්‍රස්ව ස්වර** සේ සැලකෙන්නේ කවරක් ද?

1. ආ, ඇ, ඉ, උ, ඍ, ඏ, එ, ඔ
2. අ, ඇ, ඉ, උ, ඍ, ඏ, එ, ඔ
3. ඊ, ඌ, ඍ, ඏ, එ, ඓ, ඔ, ඖ
4. අ, ඇ, උ, ඌ, ඎ, ඔ, ඕ, ඖ
5. අ, ඉ, ඊ, උ, ඌ, ඍ, එ, ඔ (.......................)

1.2 හැම පදයක ම **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පද පේළිය තෝරන්න.

1. විමර්ශණය, පිළිරුව, ප්‍රස්ථාරය, ආකර්ෂණය
2. කුෂ්ටය, මධ්‍යසාරය, ප්‍රශංසාව, පරිගණකය
3. ඓක්‍යය, ප්‍රතිඵලය, සම්ප්‍රදාය, දෘෂ්ටිය
4. මද්‍යසාරය, ප්‍රතිඵලය, ප්‍රස්තාරය, පරිගණකය
5. ලේඛණ, සම්ප්‍රදාන, ආස්වාද, කොට්ඨාශ (.......................)

1.3 **අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ව** ලියා ඇති පද පේළිය තෝරන්න.

1. අනුරාධපුරය, මහනුවර, රාගම, දඹුල්ල
2. උඩුනුවර, කඩවත, පානදුර, හම්බන්තොට
3. තංගල්ල, වවුනියාව, ගාල්ල, කැකිරාව
4. අනුරාධපුරය, කොළඹ, කඩවත, වවුනියාව
5. කඩවත, මහනුවර, නුවරඑළිය, ගාල්ල (.......................)

1.4 **තත්සම වචන** පමණක් අන්තර්ගත වරණය කුමක් ද?

1. අච්චාරු, පරිගණකය, ට්‍රැක්ටර්, ඇන්ටනා
2. පංච ශීලය, කාර්, ලොරි, ශීතකරණය
3. ගිජ්, සම්බෝල, බීම, සිරිත්
4. විරිත්, සිරිත්, පන්සිල්, චාරිත්‍ර
5. නර්ස්, චාරිත්‍ර, වාරිත්‍ර, කොම්පියුටර් (.......................)

[දෙවන පිටුව බලන්න

1.5 මුලින් දී ඇති පදයට **පර්යාය පදයක් ඇතුලත් නොවන** වරනය තෝරන්න.

1. කුරුලු - පක්ෂි, විහඟ, දද, සියොත්
2. මුහුද - සමුද්‍ර, ජලනිධි, රුවනාර, උදධි
3. අම්මා - ලමන්දා, අමදිනි, ජනේත්ති, අම්බිකා
4. මී මැස්සා - මධුලෝල, මීපා, කාංචන, සපදි
5. අනංගයා - මදන, මනෝජ්, තුනුයොත්, මල්ෂි (.......................)

1.6 සියලුම පද **නිවැරදි ව විසන්ධි කර ලියා ඇති** වරණය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| 1. | උළු + ඉඳු, | ළිඳ + පඩිය, | මහ + උත්සවය, | පස් + සිල් |
| 2. | පන් + සිල්, | නි + අවුල්, | උපන් + උපන්, | ඔබ් + නොබ |
| 3. | ඉන් + අල, | රුක් + අත්තන, | වන + කම්, | අල් + ලස් |
| 4. | විස් + කම්, | නිල් + උපුල්, | ලිග් + ගල, | රුවන් + ආකාර |
| 5. | නෙළුම් + මල්, | තොට + ඉ, | බුත් + සරණ, | ගහ + පොළ (.......................) |

1.7 **යුගල පදයක් නොවන** පදයක් සහිත පද පෙළිය තෝරන්න.

1. හතුරුමිතුරු, නැණනුවණ, ගයාවයා, ඇදපලුදු
2. සෙරෙප්පුබෙරෙප්පු, ලටපට, දනිපනි, තක්කුමුක්කු
3. රොඩුබොඩු, උකුළුමුකුළු, අඩුමකුඩුම, නටාගයා
4. කරකියා, නිතිරිති, වංහුං, ලවක්දෙවක්
5. ශුද්ධ පවිත්‍ර, වැඩේදෙල්, යාගහෝම, කලදවස (.......................)

1.8 එක් එක් පෙළියේ මුලින් දැක්වෙන පදයට **විරුද්ධාර්ථයක් සහිත පද** පෙළිය තෝරන්න.

1. සතුට - ආනන්ද, හර්ෂය, ප්‍රමෝදය, සතොස
2. දියුණුව - ප්‍රගමන, සංවර්ධනය, උන්නතිය, ප්‍රගතිය
3. චන්ද්‍රයා - තරිඳු, උළිඳු, සහසකර, තුසරකර
4. යහළුවා - මිතුරා, සකි, හිතවතා, සහළාණ
5. නෙළුම් මල - සරෝරුහ, සර, තාමරස, පද්ම (.......................)

1.9 "**බලති**" යනු,

1. ප්‍රථම පුරුෂ, බහු වචන, කර්තෘ කාරක, වර්තමාන කාල, ක්‍රියාපදයකි.
2. උත්තම පුරුෂ, බහු වචන, කර්ම කාරක, අතීත කාල, ක්‍රියාපදයකි.
3. මධ්‍යම පුරුෂ, ඒක වචන, භාව කාරක, වර්තමාන කාල, ක්‍රියාපදයකි
4. ප්‍රථම පුරුෂ, බහු වචන, කර්ම කාරක, වර්තමාන කාල, ක්‍රියාපදයකි.
5. උත්තම පුරුෂ, බහු වචන, භාව කාරක, අනාගත කාල, ක්‍රියාපදයකි. (.......................)

1.10 සියලුම වචන **එකම ව්‍යාකරණ වර්ගයට අයත් නොවන** වරණය තෝරන්න.

1. ගස්පෙළ, තරුකැල, මුවරළ, සිසුපෙළ
2. ගියොත්, සිටියොත්, ඇන්දොත්, වැස්සොත්
3. කෙනෙක්, අයෙක්, ඇතැමෙක්, සමහරු
4. අලංකාර, විසිතුරු, අවංක, මැනවින්
5. මෙන්, සේ, වගේ, බඳු (.......................)

1.11 **ප්‍රකෘති පමණක්** යෙදී ඇති වරණය තෝරන්න.

1. ඇත්, දෙන්, පින්, නැව්, ගස්
2. අලි, එළු, ළමා, රිළා, ගිරා

3. ඔරු, දෙල්, ළිං, පොල්, ළඳ
4. ගජ, තම්ර, මරණ, සුර, නර
5. නටයි, බලයි, දුවයි, පනියි, කඩයි (......................)

1.12 පහත දක්වා ඇති **සමාස ප්‍රභේද පිළිවෙළින් දැක්වෙන වරණය** තෝරන්න.

1. හෙළයන්ගේ බස - හෙළබස
2. නිල් වුයේත් උපුල් වුයේත් - නිලුපුල්
3. බල දහසක් ඇත්තේ - දසබල
4. ඉතා ප්‍රසිද්ධ - පරසිඳු (......................)

1. අන්‍යාර්ථ සමාසය, අව්‍ය සමාසය, විශේෂණ සමාසය, සම්බන්ධ විභක්ති සමාසය
2. සම්බන්ධ විභක්ති සමාසය, විශේෂණ සමාසය, අන්‍යාර්ථ සමාසය, අව්‍ය සමාසය
3. අව්‍ය සමාසය, අන්‍යාර්ථ සමාසය, විශේෂණ සමාසය, සම්බන්ධ විභක්ති සමාසය
4. විශේෂණ සමාසය, අන්‍යාර්ථ සමාසය, අව්‍ය සමාසය, සම්බන්ධ විභක්ති සමාසය
5. සම්බන්ධ විභක්ති සමාසය, අන්‍යාර්ථ සමාසය, විශේෂණ සමාසය, අව්‍ය සමාසය (......................)

1.13 **නිවැරදි උක්ත පද** යෙදී ඇති වරණය තෝරන්න.

1. මිනිසෙක්, ස්ත්‍රියක්, ඇතින්නෙක්, අඟනක
2. මම, අපි, පියාණෝ, ඇතැම්හු
3. සතුන්, කවුරුන්, අයෙක්, අඟනක්
4. ඔවුහු, රිතිහු, ඇතැම්හු, ගුරුවරියක
5. අඹ, තෙරුන්, ස්ත්‍රියක්, ගුරුවරයන් (......................)

1.14 **නිත්‍ය බහු වචන නාම පදයක් උක්තය වශයෙන් යෙදී ඇති** වරණය තෝරන්න

1. මුව රළ බිය වී දුවන්නට වන්හ.
2. අයෙක් සොරකම් කොට සිරගෙවල ලගිති.
3. දෙවියෝ අහසේ සැරිසරති.
4. එක් කෙනෙක් රැස්වීමට පැමිණියේ ය.
5. මාගේ දියණියෝ දක්ෂ ගායිකාවක් වෙයි. (......................)

1.15 **පිරුළක් නොවන්නේ,**

1. "රජකම් කළත් කළකම් පළ දේ"
2. "නියර මිටි තැනින් තමා වතුර බහින්නේ"
3. "පිරුණු කළේ දිය නොසැලේ"
4. "බොරුවට ආයුෂ අඩුයි"
5. "කිඹුල් කඳුළු හෙළනවා වගේ" (......................)

1.16 පහත සඳහන් වරණ අතුරෙන් **නිවැරදි වාක්‍ය** තෝරන්න.

1. ගියවර විභාගය සමත්වූවන් අතරෙන් වැඩි දෙනෙක් පාසල් අයදුම්කරුවන් ය
2. උපදේශකවරුන් විසින් ක්‍රීඩකයන් පුහුණු කරන ලදී.
3. පොත් පත් කියවීමෙන් සමහරු දැනුම වර්ධනය කර ගනියි.
4. සාමාජිකයෝ සියල්ලෝම ශ්‍රමදානයට පැමිණෙන බව අසා දැන පිටියෙමු
5. ඔවුන් තරඟය ජයග්‍රහණය කරත්වා! (......................)

1.17 වඩාත් ම **නිවැරදි පද බෙදීම** සහිත වාක්‍ය තෝරන්න.

1. කුන්කෝටි විසිහතර ලක්ෂ පනස් නව දහස් හාරසිය දහය යි.
2. මෙන් වතුර ජයේපාල ණයට ගනී
3. අප යන ගමන හෙට නිමා වෙයි.
4. මැණියන් දෑ වැඩිය සේක
5. ඇත් අස් රිය පාබළ යනු චතුරංගනී සේනාව වූයේය. (.......................)

1.18 **කෘදන්ත පදයක් අන්තර්ගත නොවන** වරණය තෝරන්න.

1. නටනු, බලනු, දුවනු, සිතනු
2. කියමන්, රැකිලි, ලිවීම්, රැඟුම්
3. ගැයිලි, වැයිලි, ලියවිලි, රැකිලි
4. නැගුම්, පැසුම්, කැලුම්, බැලුම්
5. ලියමන්, ලියුම්, රැඟුමන්, නටහි (.......................)

1.19 **අනුරූප වචන සංයෝගය අනුව වඩාත් නිවැරදි පද පේළිය** තෝරන්න.

1. ප්‍රථම තෑග්ග, වැඩි කළ ඉඳුනිල් මාණික්‍යය
2. සුගන්ධ කුටිය, පරිත්‍රාණ දේශනය, වෙසක් උළෙල
3. ත්‍රිපිටක ධර්මය, ශක්‍ර දිව්‍ය රාජයා, ඒකච්ඡන්ද කොට
4. අහස් ගංගාව, පාසල් බිම, බුද්ධ රශ්මිය
5. ආඥා චක්‍රය, පංච ශීලය, උද්‍යාන බිම (.......................)

1.20 **"මඩක්කුව"** යන පදය භාවිතා කරන ප්‍රදේශීය ජන වහර වන්නේ,

1. හත්කෝරළේ ජනවහර
2. බස්නාහිර ජනවහර
3. වන්නි ජනවහර
4. නුවර කලාපීය ජනවහර
5. දිගාමඩුලු ජනවහර (.......................)

(ලකුණු 20යි)

සැකසුම - **ප්‍රසාද් ද සිල්වා**

රිච්මන්ඩ් විද්‍යාලය - ගාල්ල Richmond College, Galle

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018

[illegible]

General Certificate of Education (Adv. Level) Examination, 2018

71 S II

සිංහල II
Sinhala II

පැය.03 යි

**උපදෙස් :**

* I කොටසේ පළමු ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද ඇතුලු ව **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* 01 ප්‍රශ්නයේ ඇති සියලුම අනු කොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
* I කොටස II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## II කොටස

02. අ. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අනුපිළිවෙලින් ලංකාවේ රාජධානිය බවට පත් වූ පුරප්‍රවරයන්ගේ නම් අනුව සිංහල සාහිත්‍යය ද සම්ප්‍රදායානුකූල ව ඓතිහාසික යුගවලට බෙදේ. මේ යුග වෙන වෙන ම තුලනාත්මක පරීක්ෂණයට භාජනය කිරීම මෙහි දී අවශ්‍ය නොවේ. එසේ වුව ද අනුරාධපුර යුගයට අයත් වන පද්‍ය සාහිත්‍යය වශයෙන් සීගිරි පවුරු ගී ද කාව්‍යාලංකාර ග්‍රන්ථයක් වන සියබස්ලකර ද හැර අන් කිසිදු කෘතියක් දක්නට නො ලැබෙන බව මෙහි දී සඳහන් කළ යුතුය. සීගිරි ගීවල දකනට ලැබෙන කාව්‍ය ආකෘති සිය පබැඳුම්හි යොදා ගත්තෝ විරලය හ. ඉනුදු අප දන්නේ පසු කාලයෙහි ඇති වූ කවීන් තිදෙනෙකු පමණි. ඔවුහු නම්, ගී කාව්‍ය නමින් ව්‍යවහාර ලැබූ අඛ්‍යාන කාව්‍ය තුනෙහි කර්තෘවරුය. කව්සිළුමිණ, සසදාවත, මුවදෙව්දාවත යන මේ කාව්‍ය තුන පරීක්ෂා කර බලන විට කවීන් තිදෙන ම සංස්කෘත කාව්‍යාලංකාරිකයන් අනුගමනයෙහි ලා නොමඳ ව නියැළී ඇති බව හෙළි වෙයි. සංස්කෘත බලපෑමට නතු වූ ගී කාව්‍ය කර්තෘවරු දේශීය ලක්ෂණ විරල වූ ගතානුගතික කාව්‍ය වර්ණනා පබැඳූ හ. ඔවුහු ස්වභාව ධර්මය කෙරෙහි මහත් අභිරුචියක් දැක් වූ නමුත් ස්වකීය දේශය පරිසරයෙහි දක්නට ලැබුණු ස්වභාව සෞන්දර්යයෙන් ප්‍රබෝධයක් ලැබූ බවක් සි පබැඳුමින් ස්ඵුට නො කරති සංස්කෘත කාව්‍යයෙහි හමු වූ ප්‍රකාශන ක්‍රම සහ විවිධ අලංකාර රීති ද ඔවුහු ලැදි ව අනුගමනය කළහ. රජුන්, රැජිනන්, නගර, උත්සව, ස්වභාව වස්තූන් ආදිය පිළිබඳ ඔවුන්ගේ අනේකවිධ වර්ණනා සියල්ල ම සම්පූර්ණයෙන් ම වාගේ ඒකාකරය. වෙනසක් පෙනෙන්නේ උපමා ඇතුළු අලංකරණ සකස් කර තිබෙන ආකාරයෙහි පමණි.

1. ගී කාව්‍යයෙහි ඒකාකාරීත්වය හා වෙනස්කම් මතුවන්නේ කවර අංග ආශ්‍රිතව ද?
2. ගී කාව්‍ය කතුවරුන් සංස්කෘත කාව්‍යාලංකාරයන් අනුගමනය කළ බව තහවුරු වන්නේ කවර කරුණු නිසා ද?
3. සීගිරි ගී සහ සියබස්ලකර පිළිබඳ ව සඳහන් කිරීමෙන් ලේඛකයා තහවුරු කරන්නේ කුමක් ද?
4. මෙම ඡේදයේ සඳහන් අන්දමට සිංහල සාහිත්‍යය සම්ප්‍රදායානුකූල ව ඓතිහාසික යුගවලට බෙදා ඇත්තේ කුමක් පදනම් කරගෙන ද?
5. පුරප්‍රරයන් හා තුලනාත්මක යන වචනවල අරුත පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා එහි අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ආර්ථික විශ්ලේෂණයේ දී වෙසෙසින් උපුටා නොදැක්වෙන නමුත් සංවර්ධනයේ දී අතිශයින් වැදගත් වන තවත් සැලකිය යුතු කරුණක් නම් අධ්‍යාපනය සමාජ වෙසනස්වීම් සඳහා සාධකයක් ලෙස බලපවත්නා ආකාරයයි. සංවර්ධනයේ දී පාරම්පරික සමාජ ව්‍යූහයේ පරිණාමයක් අවශ්‍ය වෙයි. තවද ඒ සඳහා වැඩි වේගවත් සමාජ චලතාවක් ද, නව්‍යකරණයට බාධක වන සිරිත් විරිත් සහ ඇගයීම් බැහැර කිරීම ද අවශ්‍ය වෙයි. මේ වෙනස්වීම් ඇති කරලීමෙහි ලා අධ්‍යාපනය බලවත් උපකරණයකි. අලුත් අදහස් පැතිරවීමෙන් ද, අලුත් සමාජ පන්ති පෝෂණය කරලීමෙන් ද මුළු සමාජය පුරාම නායකත්වය පිළිබඳ විවිධ

රටාවන්හි වෙනස්කම් එයින් ජනිත කෙරේ. ක්‍රම සම්පාදකයෝ සංවර්ධන ය හා සම්බන්ධ සමාජ සහ දේශපාලන සාධක දන්නා තරමට ම, සමාජ වෙනස්වීම් ඇති කරලීමේ මාධ්‍යයක් වශයෙන් අධ්‍යාපනයේ අති වැදගත්කම ගැන දැන ගත යුත්තෝ ය.

අධ්‍යාපනය ශුභසාධන අංගයක් වශයෙන් නොව සංවර්ධනයෙහි ලා අතිශයින් උපකාරී වන්නක් සේ අද සැලකෙන්නේ නම්, එය ප්‍රබල සහ කාර්යක්ෂම ආයුධයක් බවට පත් කර ගත යුතුය. මෙයින් අදහස් කෙරෙන්නේ අධ්‍යාපනය මුළුමනින්ම වාගේ සංවර්ධන පරමාර්ථයේ අවශ්‍යතා අනු හැඩගස්වා ගත යුතු බවයි. මූලික වශයෙන් මේ අවශ්‍යතා දෙයාකාර වෙයි. සංවර්ධනයේ උසස් තලවල දී ආර්ථිකය සඳහා අවශ්‍ය වන විශේෂ දක්ෂකම් ඇතියවුන් නියත වශයෙන් ලබා දීම ඉන් පළමු වැන්න වේ. නවීන කාර්මික ඥානය ගැන ජනතාව තුළ පිළිගැනීමක් මෙන්ම නවීන වූත්, විද්‍යාත්මක වූත්, හැඟීමක් ඇතිකර ගැනීමත් සමඟ ම සංවර්ධන අරමුණු හා ගැළපෙන අදහස් උදහස් ඇති කිරීම දෙවැන්න වේ. දෙ වැනි අවශ්‍යතාවය ඉතාම වැදගත් වෙයි. කුමන හෙයින් ද යත්, සංවර්ධනය සඳහා යොදන ප්‍රාග්ධන ප්‍රමාණයට වඩා සමාන්‍යයෙන් ජනතාව ලබාගන්නා කාර්මික දැනීම ප්‍රමාණය මූලික වන හෙයිනි.

(ලකුණු 15)

3. දී ඇති මාතෘකා වලින් එකකට අදාළව වචන **300 - 350 අතර වන සේ** ව්‍යාකරණානුකූල විශ්ලේෂණාත්මක රචනාවක් ලියන්න.

1. රටක සංවර්ධන ක්‍රියාවලියට බාධා පමුණුවන ස්වාභාවික විපත්ති
2. සාහිත්‍යාංගයක් වශයෙන් වර්තමාන ගීත ප්‍රබන්ධවල පවත්නා වැදගත්කම හා අනන්‍යතාවය
3. වසංගත රෝග නිවාරණයෙහි ලා පොදු ජනතාවගේ කාර්යභාරය
4. ශ්‍රී ලංකාවේ අනාගත සංවර්ධන ගමන් මග කෙරෙහි බලපෑම් ඇති කරන බලශක්ති අර්බුදය
5. ශ්‍රී ලංකාවේ පැරණි ජනජීවිතය හා බැඳුණු වාපි සංස්කෘතිය
6. කායික මානසික සමබරතාව කෙරෙහි ක්‍රීඩාව සමගින් ඇතිවන බලපෑම

(ලකුණු 25)

4. අ. පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

1. මෙබඳු අපරාධ කවුරු හෙළා නො දකියිද ?
2. ගුරුතුමා විසින් අපි දක්නා ලදී
3. තැන තැන පියුම් පොකුණු වූහ
4. මා සින්දු කියද්දී ඈ අසා සිටියා ය.
5. දරුවන් දෙමව්පියන්ගේ උපදෙස් පිළිපදිත් නම් ඉතා අගනේ ය. (ලකුණු 05)

ආ. පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න

1. රාජ්‍ය නායකයා විදේශ තානාපතිවරුන් සේවාවෙන් ඉවත් කරයි
2. ප්‍රකට ගත්කතුවරු තම ග්‍රන්ථ රචනය සඳහා විවිධ භාෂාරීතින් භාවිතයට ගත්හ.
3. සොර මුළ ළමයෙකු පැහැර ගත්හ
4. විනිශ්චය මණ්ඩල සාමාජිකයෝ ගෞරව සම්මානයකින් මා පුදති.
5. හෙතෙම කතුරකින් කඩදාසි කොළ කැපුවේය. (ලකුණු 05)

ඉ. නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

1. පයින් (යන්නෝ /යන්නන්) දකුණු පසින් ගමන් කළ යුතුය.
2. ඒ දුම්රියෙහි (කාන්තාවන් / කාන්තාවෝ) උදෙසා වෙන් වූ මැදිරියක් ඇත.
3. ලේකම්තුමා හෝ සභාපතිතුමිය හෝ ඒ රැස්වීමට සහභාගී (වන්නේ ය / වන්නීය)
4. (වවන්නෝ / වවන්නන්) දිනන්නෝ ලු.
5. මාර්ටින් (වික්‍රමසිංහයෝ / වික්‍රමසිංහයන්) ගම්පෙරළිය රචනා කළහ. (ලකුණු 05)

5. අ. පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් දක්වා ඇති පදවල අර්ථ විග්‍රහ කර ලියන්න.

1. බුදුරජාණන් වහන්සේ **ධරමාන** කාලයේ දී ම විවිධ ශාසනික විලෝපන සිදු විය
2. **ඉච්ඡා භංගත්වයට** පත් තරුණ පිරිස් රට හැර යති
3. **සමයසමයාන්තර ඥාන වර්ධනය** පිණිස ධර්ම ග්‍රන්ථ කියවීම අතිශයෝපකාරී ය.

(ලකුණු 03 යි)

ආ. පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් සුදුසු **තනි පද** ලියන්න.

1. රජකුගේ ඔටුනු පැළඳවීමේ උත්සවය
2. කැමති අදහස් ඉටු වීම
3. සිඳී - බිඳී විනාශ වූ දේ නැවත සකස් කිරීම

(ලකුණු 03)

ඉ. පහත දී ඇති වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

1. සාහිත්‍ය රසවින්දනය හා විචාරය උදෙසා ................. මාර්ගයක් වෙත අවතීර්ණ විය යුතුය.
2. ප්‍රවීණ ගායකයා .............................. වේදිකාව පසු පස හඬා යන්නෙක් නොවේ.
3. ලෝකයේ කණ්ඩායම සභා ........................... උද්දීප්තියට පත් කළහ.
4. චීනය හා ඉන්දියාව ආසියාවේ යෝධයන් සේ ...................... සමෘද්ධියට පත්වෙමින් සිටියි.
5. සරාසඳ තරු රැස සමග උදාවී නුබ .................................. ආලෝකවත් කළේ ය.

(ලකුණු 03 යි)

ඊ. තද කළු අකුරින් දක්වා ඇති බහු අර්ථ පදය යොදා වෙනත් අරුතක් දෙන ලෙස වාක්‍යය බැගින් තනන්න.

1. ඔහු කියත් **තල** ගලෙව ලෙන් - ගෙට ගොස් විකුනා ජීවත් විය
2. හස්තිරාජයා තම **දළ** දෙකෙන් පර්වතයට ඇන්නේය.
3. **ගත** සිත සනසා ගනු පිණිස ඔහු භාවනාවට යොමු විය.
4. ගැහැනිය ගමට යනු **වස්** බස්රියට නැගුණා ය
5. අගොස්තු **මස** 31 දින රජයේ නිවාඩු දවසකි.
6. මුවදෙව්දා**වත** ඛණ්ඩ කාව්‍යයකි.

(ලකුණු 06)

6. තද කළු අකුරින් දක්වා ඇති පද කුමන ව්‍යාකරණ අංගයකට අයත් දැයි දක්වන්න

1. **දකුණතින්** ගත් කඩුව **ලෙළවමින්** ඔහු අතිදක්ෂ ලෙස සටන් කළේය
2. **ශ්‍රී ලාංකික පුවත්පත් කලාව වනාහී** තව තවත් සංවර්ධනවිය යුතු අංශයකි.
3. **පැරකුම්බා මහරජ වැව්අමුණු** තනවා සහලින් රට සමෘද්ධිමත් කළේය
4. **ගුණනුවණ** පිරි **ළමා පරපුරක්** බිහි කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ එක් සුවිශේෂී කාර්යයකි.
5. **වෙසක් පොහොය** නිමිත්තෙන් දර්ශනීය තොරණක් ඉදිකර ප්‍රදර්ශනය කරන ලදී.

(ලකුණු 15 යි)

7. අ. පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් ගැළපෙන **ප්‍රස්තාව පිරුළ** ලියන්න.

1 කිසියම් වේදනාවක් ඇති කෙනෙකුට තවත් වේදනාවක් දීම
2. වයසට හෝ තරාතිරමට හෝ නොගැළපෙන ක්‍රියාවක කිරත වීම
3. ඉතා සුළු කරුණකින් පවා කිපීම
4. මහන්සි වූ තරමට ප්‍රතිඵල නොලැබීම
5. උදාර සේවයක් සිදුකොට අවසානයේ සුළු වරදක් කිරීම
6. නිෂ්ඵල දෙයක් සඳහා මහන්සි වීම

(ලකුණු 03)

ආ. පහත දී ඇති **රූඩීවල අදහස** පැහැදිලි වන සේ වාක්‍ය වල යොදන්න.

1. ජාඩියට මූඩිය වගේ
2. ඉහවහා යාම
3. උඩගෙඩි දීම
4. අනුනවයෙන් බේරුණා
5. දෙබරේට ගල් ගැසීම
6. වැල්වටාරම් දෙඩීම

(ලකුණු 03)

ඉ. පහත දී ඇති එක් එක් **යුගල පද** සෑදී ඇති රටාව කුමක් දැයි දක්වන්න.

1. උදව් - උපකාර
2. රෙදි - පෙරෙදි
3. චිං - හුං
4. ගොඩ මඩ
5. සොයා - බලා
6. ඇඳුම් - ආයිත්තම්

(ලකුණු 03)

ඊ. පහත දී ඇති ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද ලියා දක්වන්න

1. වංගිය
2. කටගහනවා
3. පාරම්බානවා
4. හේලංකඩ
5. පාරවටුව
6. පැලපදියං වීම

(ලකුණු 03)

උ. පහත දී ඇති ප්‍රාස්තාවික ව්‍යවහාරයන්ට දිය හැකි පොදු භාවිතයේ යෙදෙන අරුත් පැහැදිලි කරන්න.

1. අසානාසි වීම
2. අඩුක්කු
3. බැත
4. අත්තම
5. වඩදිය
6. ආතුරයා

(ලකුණු 03)

8. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

උගතයුත්තක්වශයෙන්භාෂාවෙහිදඅන්තර්ගතයක්ඇතිබත්වහරෙහිසදොස්නිදොස්උචිතඅනුචිතඋසස්පහත් පවතිනබවත්පිළිගතමනායඒඅතුරින්නිදොස්වූත්උචිතවූත්උසස්වූත්ලක්ෂණසියවහරෙහියොදන්නෝතමනට අවැසිනිරවුල්වූත්රසවත්වූත්බලවත්වූත්භාෂාරීතියක්නිෂ්පාදනයකරගනිතිසිංහලයඋසස්සංස්කෘතියෙක වාහකය බවටපත්වූයේමෙයටදෙදහස්වසරකටදපෙරයවිෂයකවරක්වේවාඒපිළිබඳඅදහස්ප්‍රකාශකිරීමේමාධ්‍යයක් වශයෙන්කවරදාවුවසිංහලයදූබලතාවක්නොදැක්වියදැනුදුනොදක්වයිවාක්කෝෂයඑහිලාප්‍රමාණවත්ය.

1. ඉහත ඡේදය ශාස්ත්‍රීය යැයි බොහෝ සෙයින් ම පිළිගත් ක්‍රමය අනුව **පද බෙදා විරාම ලක්ෂණ යොදා** නැවත ලියන්න.
2. **"රකාරාංශය"** සහිත පද දෙකක් ඡේදයෙන් උපුටා දක්වන්න
3. ඡේදයේ සඳහන් **"ගැටය සහිත ඇලපිල්ල", "යංශය"** අන්තර්ගත **වචන දෙකක්** ලියා දක්වන්න
4. ඡේදයේ ඇති **"අනුචිත"** යන පදයෙහි ඇතුළත් **පිල්ලම්** නම් කරන්න.
5. **"රේඑය"** අන්තර්ගත ඔබ දන්නා **පදයක්** ලියන්න.

(ලකුණු 15)

සැකසුම : - **ප්‍රසාද් ද සිල්වා**